| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| 06 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව I - II | කාලය |

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

වරහන් තුළ දී ඇති වචන වලින් න්වැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(නළුවා,නිරීක්ෂණය,පරිසරය,අධිමානුෂ,ජනකතා)

1. සත්ත්ව චරියා ඉදිරිපත් කිරීමේදී කිරීමේදී .............................. අත්‍යවශ්‍ය වේ.

2. රූපණ කාර්යේදී වැදගත් වනුයේ .............................. ය.

3. පාරම්පරික දායාදයකි ..............................

4. නිර්මාණාත්මක රංගයක් ඉදිරිපත් කිරීමේදී .............................. අශ්‍රිත සිද්ධි ඉවහල් වේ.

5 මානුෂ හා .............................. යනුවෙන් සත්ත්ව චරියා දක්නට ලැබේ.

වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. නාට්‍යයක් යනු,

I. කතාවක් කීමය. II. දෙබස් ඉදිරිපත් කිරීමය.

III. යමක් සිදු වූ අයුරු කර පෙන්වීමය. IV. චරිතයට පිවිසීමයි.

12. නාට්‍යයක සංවාද මඟින් සිදුවනුයේ,

I. නාට්‍යයේ සිදුවීම ඉදිරියට ගෙන යෑමයි.

II. චරිත විග්‍රහ කිරීමයි.

III. කුතුහලය දැනවීමයි.

IV. ඉහත සියල්ලමය.

13.අභිනයේ ප්‍රභේද,

I. 2කි. II. 3කි. III. 4කි. IV. 5කි.

14.මුහුණේ හැඟීම් ප්‍රකාශ කිරීම,

I. සාත්වික අභිනයයි. II. ආංගික අභිනයයි.

III. වාචික අභිනයයි. IV. ආහාර්ය අභිනයයි.

15.සමාරෝපය යනු,

I. නළුවකු චරිතයට පිවිසීමය.

II. නළුවකු දෙබස් ඉදිරිපත් කිරීමය.

III. නළුවකු රූපණයේ යෙදීමය.

IV. නළුවකු ගීත ගායනය කිරීමය.

පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන තුළ යොදන්න.

16. නාට්‍ය පෙළ නිර්මාණය කරනුයේ නාට්‍ය රචකයාය. ( )

17. අලුතින් යමක් සිතීම හෝ මවා ගැනීමට ඇති හැකියාව පරිකල්පන ශක්තියයි. ( )

18. දෙබස් භාවිතය අයත් වනුයේ ආහාර්ය අභිනයටය. ( )

19. නාට්‍ය අධ්‍යක්ෂවරයා යනු රූපණයේ යෙදෙන්නාය. ( )

20. රංග විධාන අවශ්‍ය වන්නේ නාට්‍යයේ පසුබිම හඳුනා ගැනීමට පමණි. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.**

1. I. මිනිස් ජීවිතය යහමඟට හරවන සිරිත් විරිත් පිළිබඳ ලියවුණු ග්‍රන්ථයක් නම් කරන්න.

   II. සිරිත්මල්දම ඇසුරින් සතුනට ආදරය කිරීමට ඔබ ක්‍රියා කරන්නේ කෙසේද?

   III. දෙමව්පියන්ට සැලකීමේදී නොසැලකිය යුතු කරුණු ලෙස සිරිත්මල්දම ග්‍රන්ථයේ දැක්වෙන කරුණු 2ක් දක්වන්න.

   IV. නාට්‍යයකට පිටපතක් සෑදීමේ දී සිරිත්මල්දම ග්‍රන්ථයෙන් ගතහැකි තේමාවන් නම් කරන්න.

   V. සමාජයේ යහපත් දරුවකු ලෙෂ ජීවත් වීමට ඔබ සිරිත්මල්දම ග්‍රන්ථයෙන් උගත හැකි කරුණු දෙකක් දක්වන්න.

2. I. “අහස කඩා වැටීම” නම් කතාවේ එන ප්‍රධාන චරිතය කුමක්ද?

   II. එම කතාවෙන් ජීවිතයට ලබාගත හැකි ආදර්ශය කුමක්ද?

   III. ඔබ දන්නා එවැනි තවත් ජනකතා දෙකක් ඇසුරින් ජීවිතයට උගත හැකි ආදර්ශයන් දෙකක් දක්වන්න.

3. I. භූමිකාවක් යනු කුමක්ද?

   II. ඔබ පාසල් ශිෂ්‍යයකුගේ චරිතය රඟපාන්නේ නම් ඔබ එම චරිතයේ රඟපාන වෙනත් භූමිකා 2ක් නම් කරන්න.

   III. ඉහත චරිතය රඟපෑමේදී එම චරිතය සාර්ථකව ඉදිරිපත් කිරීමට අවශ්‍යවන කරුණු 4ක් දක්වන්න.

4. I. පහත සඳහන් පරිසර අත්දැකීම් පාදක කොට ගෙන කතාන්දරයක් ගොඩ නඟන්න.

   බැලයක අඹ ගසක්,ගසක කූඩුවක්, කුරුළු පැටවුන් දොරට වඩින දවසත්, ගසයට තුඹසත්, ඉන් එළියට එන නාගයෙක් , කුරුළු මවගේ හැඬීමත්, තුඹස අසළට එන මුගටියෙක්.

   II. ඔබ ලියූ එම කතාවට නමක් යෝජනා කරන්න.